**ගම්පහ මහා නගර සභාව - 2022**
**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගම්පහ මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගම්පහ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති 3.3 ප්‍රකාරව හුවමාරු නොවන ගනුදෙනුවලින් ආදායම් හඳුනාගන්නේ ඒවා උපචිත වූ විට බව දක්වා ඇතත්, මුද්දර ගාස්තු ආදායම ගිණුම්ගත කිරීම සඳහා එක් නිශ්චිත පදනමක් යොදාගෙන නොතිබුණි. | මුද්දර ගාස්තු බිල් කළ ආදායම, ආදායමක් ලෙස උපචිත පදනම යටතේ රු.මිලියන 123 ක මුදලක් ගිණුම් ගත කර ඇති බව. | උපචිත පදනම යටතේ ප්‍රවර්තන වර්ෂයට අදාළ ආදායම ගිණුම් ගත කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කරන මාරුකිරීම් අයභාරයක් ලෙස, 2020 වර්ෂයේ රු.66,965,713 ක් සාවද්‍ය ලෙස ගිණුම්ගත කර තිබුණු අතර, 2021 වර්ෂයේ රු.6,616,947 ක් ගිණුම්ගත කර නොතිබුණි. මෙම වරද සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින්ද නිවැරදිකර නොතිබුණි. | සභාවට අදායමක් හෙයින් "ආදායමක් " ලෙස ගිණුම් ගත කර ඇත. එම ප්‍රදානයන්ගෙන් ජනිත වත්කම් ක්ෂය කර ඇති බව. | ප්‍රාග්ධන ප්‍රදාන, ලද වර්ෂයට පසු වර්ෂයේ සිට අදාළ ක්ෂය ප්‍රතිශතය යටතේ අයභාරයක් ලෙස ගිණුම් ගතකල යුතුය. |
| (ආ ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් රු.6,443,786 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පලාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිත 9.5 ප්‍රකාරව ලද ප්‍රදාන එම වර්ෂයේදීම අයභාර ලෙස ගිණුම්ගත කර ඇති බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම රු. 6,443,786 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.52,640 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. පොළී අනුපාතය බැංකුවෙන් ස්ථිර කර ගෙන ගැලපුම් කරන බව. | පොලී ආදායම නිවැරදිව ගිණුම් ගතකල යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් විෂයයන් 06 ක ශේෂ එකතුව, මූල්‍ය ප්‍රකාශනය සහ හිඟ ආදායම් වාර්තාව අතර රු.4,333,755 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන අනුව හිඟය නිවැරදි වන අතර හිඟ ආදායම් වාර්තාව සංශෝධනයට කටයුතු කරමින් පවතින බව. | වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 07 ක ශේෂ එකතුව සහ උපලේඛන අනුව ශේෂ එකතුව අතර රු.6,480,924ක වෙනසක් විය. | යක්කල උප කාර්යාලයේ හිඟ මුදල ගණනයට ගෙන නොමැති බව. | -එම- |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.8,633,172 ක් වූ ශේෂයන් 5 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරන බව. | ලේඛන සකස් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 වගන්තිය | 2005 හා 2011 වර්ෂවලදී කරන ලද තක්සේරු පදනම් කරගෙන ප්‍රවර්තන වර්ෂයේ වරිපනම් අයකර තිබුණි. | මෙම කාර්යය 2023 දෙසැම්බර් වන විට අවසන් කර 2024 වර්ෂයේදී නව තක්සේරු අනුව කටයුතු කරන බව. | වරිපනම් දේපළ තක්සේරුව කරවාගෙන, ඒ අනුව වරිපනම් අය කළ යුතුය. |
| (ආ) | අංක 2155/6 හා 2019 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය අනුව මහා නගර සහා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග | | | . |
| | (i) 08 | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කරන ලද්දේ දින 23 ක් ප්‍රමාද වී 2023 මාර්තු 23 දින දීය. | පිළිගන්නා බව. ඉදිරි වර්ෂයේ නියමිත දිනට මූල්‍ය ප්‍රකාශනය ලබා දෙන බව. | පෙබරවාරි 28 දින හෝ ඊට පෙර ගිණුම් ලබාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 83 II | අයවිය යුතු සේවක ණය සඳහා අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | කාර්යාලයේ සේවක ණය ගිණුමක් යාවත්කාලීනව පවතින බව. | නියෝග අනුව අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යා යුතුය. |
| (iii) 306 | අය කරනු ලබන ඉඩම් විකිණීම මත බදු සම්බන්ධ තොරතුරු ලේඛනයක් යටතේ පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී තොරතුරු ලබා ගත හැකි වන සේ ලේඛනයක් සකස් කර ඇති බව. | තොරතුරු ලබාගත හැකිවන පරිදි ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) 396 (ආ) | වසර ගණනාවක සිට පැවත එන රු.356,560 ක අගරු චෙක්පත් 8 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | ඉතිරි මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව මුදලින් අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) 396(ඇ) | රු.328,793 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 6 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි | ඉදිරි කටයුතු සඳහා යොමුකර ඇති බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය |
| (iii) 571(1) හා (2) | 1977 වර්ෂයේ සිට පැවත එන රු 57,798,854 ක් වූ වසර 2 ඉක්ම වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | ඉදිරියේදී ගෙවීමට තැන්පත් ගිණුමේ රඳවා ගත යුතු බව. | මුදල් රෙගුලාසි අනුව තැන්පතු නියාදනය කළ යුතුය |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.53,423,602 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.205,354,800 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මාසිකව කල් පිරෙන රු.67,359,947 ක් වටිනා ස්ථාවර තැන්පතු 07 ක් කල්පිරී දින 8 සිට 17 දක්වා කාලයක් ගෙවී යාමෙන් පසුව ආපසු ගැනීම නිසා එම කාලසීමාවට අදාල පොළී ආදායම අහිමිවී තිබූ අතර, සාමාන්‍ය ඉතුරුම් පොළී ආදායමක්ද ලැබී නොතිබුණි. | නිවැරදිය. සභාවේ හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට නගරාධිපතිතුමාගේ නියෝග යටතේ ක්‍රියා කර ඇති බව. | පොළී ආදායම අහිමිවී නොයන පරිදි ස්ථාවර තැන්පතු ආපසුගත යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලයට අදාලව , සමාලෝචිත වර්ෂයේදී සහ පෙර | 2022 වර්ෂයේ ලැබිය යුතු බිල් කළ ආදායමට අතිරේකව ලද මුදල් ඉදිරියට | අත්තිකාරම් ලබාගැනීමේදී ඉදිරි වර්ෂයේ මුදල් |

| | | |
|---|---|---|
| වර්ෂයේදී ලද රු.123,108,175 ක්, මුද්දර ආදායම ලෙස සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර තිබුණි. 2023 වර්ෂයේ අයවැයගත මුද්දර ආදායම රු.120,000,000 ක් වුවත් එයින් සියයට 98 ක් වූ රු.117,562,605 ක් සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් ලෙස මුදලින් ලබාගෙන එය ඉදිරියට ලද ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙය 2021 වර්ෂයේ ලබාගෙන තිබුණු අත්තිකාරම මෙන් සියයට 249 ක් වැනි විශාල ප්‍රතිශතයක් වී තිබුණි. | ලද ආදායම ලෙස ගිණුම් ගත කර ඇති බව. | ප්‍රවාහයට වන බලපෑම පිළිබඳව සැලකිල්ලට ගතයුතුය. |

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | | 2021 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 84,501,500 | 102,621,334 | 70,352,564 | 89,286,429 | 84,003,000 | 89,805,713 | 47,742,228 | 76,279,551 |
| (ii) | කුලී | 38,670,000 | 40,507,851 | 25,684,786 | 45,108,379 | 39,100,000 | 39,699,223 | 24,289,465 | 36,499,966 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,800,000 | 5,365,608 | 4,974,608 | 717,427 | 4,000,000 | 3,966,099 | 3,866,099 | 417,427 |
| (iv) | වෙනත් ආදායම් | 367,411,000 | 464,185,713 | 463,168,538 | 84,503,489 | 499,729,000 | 390,282,460 | 217,847,126 | 88,051,101 |
| | | ------------- | ------------- | ------------- | ------------- | ------------- | ------------- | ------------- | ------------- |
| | | 496,382,500 | 612,680,506 | 564,180,496 | 219,615,724 | 626,832,000 | 523,753,495 | 293,744,918 | 201,248,045 |
| | | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== |

2.3.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බිල්කළ වටිනාකම රු.74,732,223 ක් සහ අය කරගත් වටිනාකම රු.45,580,286 ක් වුයෙන් අයකර නොගත් ප්‍රතිශතය සියයට 39 ක් වී තිබුණි. | 2022 වර්ෂයේ සෑම කාර්තුවක් අවසානයේදී රතු නිවේදන නිකුත් කර ඇති බව. | පනත අනුව වරිපනම් ආදායම අයකළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ වරිපනම් වටිනාකම රු.70,222,910 ක් වූ අතර, වර්ෂය තුල අය කරගත් වටිනාකම රු.19,024,468 ක් වීමෙන් අයකර නොගත් ප්‍රතිශතය සියයට 73 ක් විය. | සෑම කාර්තුවක් අවසානයේදීම ආදායම් පරික්ෂක නිලධාරින්ට ලබා දෙන රු.50,000/=ට වැඩි හිඟ ලැයිස්තුවට රතු නිවේදන නිකුත් කර ඇති බව. | -එම- |

(ආ) විනෝද බදු

| | | | |
|---|---|---|---|
| | විනෝද බදු බිල්කළ වටිනාකම රු.2,466,833 කින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණු අතර වර්ෂයේ ආරම්භක දිනට හිඟ විනෝද බදු වටිනාකම රු.5,200,451 කින් වර්ෂය තුළ අයකර තිබූ වටිනාකම රු.27,425 ක් විය. | මෙම හිඟය සිනමාහල් 05 කින් පවතී. ඉතිරි මුදල් අයකර ගැනීමට නීති කර්තව්‍යයන් අරඹා ඇති බව. | හිග විනෝද බදු ආදායම අයකළ යුතුය. |

(ඇ) බලපත්‍ර ගාස්තු

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟව පැවති වෙළඳ බලපත්‍ර ගාස්තු වටිනාකම රු.417,427 කින් අයකර තිබූ වටිනාකම රු.91,000 ක් විය. | බලපත්‍රලාභීන් 07 කගේ හිඟ මුදල් කපා හැරීම සඳහා අනුමැතියට යවා ඇති අතර අනෙකුත් බලපත්‍රලාභීන් සඳහා නීති කටයුතු අරඹා ඇති බව. | හිග බලපත්‍ර ගාස්තු ආදායම අයකළ යුතුය. |

(ඇ) කුලී

| | | | |
|---|---|---|---|
| (i) | වෙළඳ ස්ථාන කුලී, වර්ෂය තුල බිල්කළ වටිනාකම රු.33,730,902 ක් සහ අයකළ වටිනාකම රු.21,056,412 ක් වීමෙන් අයකර නොගත් ප්‍රතිශතය සියයට 38 ක් විය. | ජනතාවගේ ඉල්ලීම් සහ දේශපාලන මැදිහත්වීමෙන් සහන ලබාදී ඇත. හිඟ අයකර ගැනීමට දැනුවත් කරමින් පවතී. ප්‍රතිචාර නොලැබෙන්නේ නම් යළි මුද්‍රා තබා පවරා ගැනීමට කටයුතු කරන බව. | හිග වෙළඳ ස්ථාන කුලී ආදායම අයකළ යුතුය |
| (ii) | හිඟ වෙළඳ ස්ථාන කුලී, සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වටිනාකම රු.26,028,316 ක් සහ අය කළ වටිනාකමට රු.6,134,214 ක් වූයෙන් අයකර නොගත් ප්‍රතිශතය සියයට 76 ක් විය. | ජනතාවගේ ඉල්ලීම් සහ දේශපාලන මැදිහත්වීමෙන් සහන ලබාදී ඇත. හිඟ අයකර ගැනීමට දැනුවත් කරමින් පවතී. ප්‍රතිචාර නොලැබෙන්නේ නම් යළි මුද්‍රා තබා පවරා ගැනීමට කටයුතු කරන බව. | හිග වෙළඳ ස්ථාන කුලී ආදායම අයකළ යුතුය |
| (iii) | කඩා ඉවත්කළ පොදු වෙළඳපල කඩ කාමර 142 කින් හිඟ කඩ කුලිය රු.2,311,107 ක් 2022 අගෝස්තු 31 දින වන විටත් අයකර ගැනීමට පැවති අතර, එයින් කඩ හිමියන් 97 දෙනෙකුට හිඟ කඩ කුලී අයකරගැනීමකින් තොරව තාවකාලික කඩ කාමර 98 ක් බදු ගිවිසුම්ගතවී ප්‍රදානය කර තිබුණි. | ඉදිරියටද අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | හිග කඩ කුලිය අයකළ යුතුය |
| (iv) | ගම්පහ මහා නගර සභාව සතු කඩ කාමර 30 ක් විගණිත දිනය වූ 2023 ජනවාරි 16 දින වන විටත් ටෙන්ඩර් කර බදු දී නොතිබුණි. | ගැටළු නිරාකරණය වූ කඩ කාමර ඉදිරියේදී ටෙන්ඩර් කරන බව. | කඩ කාමර බදු දී කුලි අදායම අයකළ යුතුය |
| (ඉ) | යක්කල සාප්පු සංකීර්ණයේ පැරණි බදුකරුවන් පස් දෙනෙකුගෙන් සහ නව බදුකරුවන් හතර දෙනෙකුගෙන් මුළු හිඟ පෙර මුදල රු.8,138,394 ක් අයකරගෙන නොතිබුණි. මේ අතර පැරණි | මෙතෙක් යතුරු ලබා දී නැත. හිඟ ගෙවා යතුරු භාර ගන්නා ලෙස ලිඛිතව දන්වා ඇතත් මෙතෙක් ගෙවා නැත. සභා තීරණයක් | හිග හිග පෙර මුදල් ආදායම අයකළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | බදුකරුවෙකුගේ කඩ කාමර 3 ක් හිඟ පෙර මුදල් රු.3,022,141 ක් තිබියදී, නව බදුකරුවෙකු ලෙස තවත් කඩ කාමරයක් ලබාදී තිබුණි. | මත අංක 56 කඩ කාමරය ලබාදී ඇති බව. | |
| (ඊ) | තානායම් කුලී සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වටිනාකම රු.5,954,355 ක් සහ වර්ෂයේ බිල් කිරීම රු.1,364,225 ක් වීමෙන් මුළු හිඟ වටිනාකම රු.7,318,580 ක් අයකර ගැනීමට පැවතුණි. | මෙය නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරාගෙන ඇති අතර, කුලී කරු හා වෙනත් පාර්ශවයන් අතර නඩු කටයුතු පවතින බැවින් එම තීරණයෙන් අනතුරුව ගෙවීම් කරන බව දන්වා ඇති බව. | හිඟ තානායම් කුලී ආදායම අයකළ යුතුය |

(උ) බදුකර කුලී

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති බදුකර කුලී වටිනාකම රු.4,439,346 න් කිසිදු මුදලක් අයකර නොතිබුණි. | රු.1,576,029 ක මුදල අයකර ගැනීම සඳහා මේ වන විට නීතිමය කටයුතු අරඹා ඇති බව. | හිඟ බදුකර කුලී ආදායම අයකළ යුතුය |

(ඌ) වෙනත් ආදායම්

| | | |
|---|---|---|
| හිඟ වෙනත් ආදායම් ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වටිනාකම රු.88,051,101 ක් වූ අතර, වර්ෂය තුල අයකර තිබූ වටිනාකම රු.4,564,787 ක් විය. | හිඟ මුදලේ විශාලත්වය අනු පිළිවෙලට තෝරාගෙන අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ වෙනත් ආදායම් ආදායම අයකළ යුතුය. |

(එ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| 2020, 2021 හා 2022 වර්ෂයන් සඳහා මුද්දර ගාස්තු උපලේඛන සහ ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2021 හා 2022 වර්ෂයන් සඳහා උසාවි දඩ උපලේඛන සකස්කර අයකරගෙන නොතිබුණි. | මුද්දර ගාස්තු හා උසාවි දඩ කාලාවරෝධයට යටත්ව වර්ෂ 03 ක් තුළ අයකර කර ගත හැකි බව. | උපලේඛන සකස්කර වර්ෂට අදාළ ආදායම ගිණුම්ගතකර අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි අයවැය ලේඛනයට සමගාමීව සියළු අයිතම්වලට ප්‍රතිපාදන වටිනාකම් ඇතුලත්කර, කාර්තුමය භෞතික හා මූල්‍ය ඉලක්ක දක්වා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රගතිය සකස් කර නොතිබුණි. | ඉදිරියේදී එම තොරතුරු කාර්තුමය වශයෙන් ඇතුළත් කිරීමට කටයුතු කරන බව සහ ක්‍රියාකාරී සැලැස්ම අනුව වාර්ෂික ප්‍රගතිය සකස් කර ඇති බව. | ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව සකස් කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගම්පහ ප්‍රධාන කාර්යාලයට අදාලව 2018 මාර්තු 16 සහ 2015 ජූලි 08 යන දිනවලදී ද, යක්කල උප කාර්යාලයට අදාලව 2019 ජුනි 19 දිනද, සියයට 1 ක ඉඩම් විකිණීමේ බදු මුදල ලෙස පෞද්ගලික සමාගමක් පිළිවෙලින් රු.1,134,100 ක්, රු.1,054,342 ක් සහ රු.8,397,175 ක් මහා නගර සභාව වෙත ගෙවා තිබුණි. ඊට අදාලව ක්‍රීඩා හා විනෝද කටයුතු සඳහා වෙන් කරන සියයට 10 භූමි ප්‍රමාණයේ (පොදු ඉඩම) ඔප්පු 2023 ජුනි 16 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි. | අක්කරයට වැඩි ඉඩම් අනුමත කරනු ලබන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන් වන අතර නාගරික සංවර්ධන අධිකාරියෙන් මෙම ඉඩම් සම්බන්ධ තොරතුරු ලබා ගෙන ඉදිරියේදී මෙම ඉඩම් පවරා ගැනීමට අදාල කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බව. | සියයට 10 භූමි ප්‍රමාණයේ ඔප්පු ලබාගත යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු වාහන 13 ක් සඳහා 1993 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මිලදීගත් හෝ ලැබුණු දිනයේ සිට විගණිත දිනය වූ 2023 ජනවාරි 18 දින දක්වා ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණු අතර, සියළු ලොග් සටහන් පොත් නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි. | මේ වන විට සියළු වාහන සඳහා ඉන්ධන දහන පරික්ෂණ කටයුතු සහ වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. | ඉන්ධන දහන පරීක්ෂාව සහ සියළු ලොග් සටහන් පොත් යාවත්කාලීන කළ යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | නිල නිවාසයක් භාවිතා නොකිරීම නිසා ගරා වැටී තිබුණු අතර ජීව වායු ඒකකය නිෂ්කාර්යව තිබුණි. | අපහරණය කළ යුතු භාණ්ඩ ඉවත් කළ වහාම නිල නිවාසය කඩා ඉවත් කරනු ලැබේ. ජීව වායුව ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසා වායුව වාතලයට මුදා හරින අතර, ඉදිරියේදී අවට නිවැසියන්ට සහ ආපන ශාලාවට ලබාදීමට කටයුතු කරන බව. | වත්කම් භාවිතයට ගත හැකි පරිදි නඩත්තු කල යුතුය. |
| (ii) | ට්‍රැක්ටර 3 ක්, ටේලරයක් සහ මාර්ග කම්පන තලනයක්, 2022 ජනවාරි 22 දින වන විටත් නිෂ්ක්‍රියව පැවතුණි | අළුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතින අතර මාර්ග කම්පන තලනය ඉදිරියේදී අපහරණය කරන බව. | වත්කම් භාවිතයට ගත නොහැකි නම් අළුත්වැඩියාව හෝ අපහරණය කල යුතුය. |
| (iii) | 2021 දෙසැම්බර් 31 දින සිදුකරන ලද රථවාහන හා යන්ත්‍රෝපකරණ සමීක්ෂණ වාර්තාව මගින් විකිණීමට නිර්දේශකර තිබුණු ටේලරයක් සහ ට්‍රැක්ටරයක් 2023 ජනවාරි 25 වන දින වනවිටත් දිරාපත් වෙමින් පැවතුණි. | අළුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතින බව. | සමීක්ෂණ වාර්තාව අනුව කටයුතු කල යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගම්පහ ප්‍රාදේශීය සභාවෙන් ගම්පහ මහා නගර සභාව වෙත 2006 අප්‍රේල් 28 දිනැති ගැසට්පත්‍රය මගින් වත්කම් පැවරීමේදී, සුසාන භූමි 3 කට අදාලව පවරන ලද ඉඩම් ප්‍රමාණය හා පිඹුරුපත් අනුව ඉඩම් ප්‍රමාණය පර්චස් 239.29 කින් අඩුවී තිබුණි. | පිළිගන්නා බව. | වෙනසට හේතු සොයාබලා අනවසර ඉඩම් අත්පත් කර ගැනීම් ඉවත් කල යුතුය. |
| (ආ) | සභාව සතු රු.මිලියන 1,597 ක් වටිනා සුසාන භූමි 20 ක් සඳහා හිමිකම් ඔප්පුද. වටිනාකම රු.මිලියන 3,862 ක් වන ඉඩම් 36 ක් සඳහා හිමිකම් ඔප්පු හා පිඹුරුපත් නොතිබුණු අතර, සුසාන භූමි 14 ක් සඳහා මායිම් ලකුණු කර නොතිබුණි. | මේ වන විට සුසාන භූමි මැනීම් කටයුතු සිදු කරමින් පවතින බව. | හිමිකම් ඔප්පු හා පිඹුරුපත් සකස්කර මායිම් ලකුණු කල යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කරමින් පවතින බව. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතුය. |
| (ආ) | අඩු ආදායම්ලාභීන් වෙත බෙදා දීම සඳහා රු.9,995,000 ක් වටිනා සහල් මිලදී ගැනීම | | |
| (i) | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි මෙවැනි වැඩසටහනක් නොතිබුණි | රටේ හටගත් අයහපත් ආර්ථික තත්ත්වය ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන අවස්ථාවේදී පුරෝකථනය කල නොහැකි වූ බව. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළයුතු අතර අවශ්‍යතාවය අනුව සංශෝධනය කර අනුමත කර ගත යුතුය. |
| (ii) | වසම් 33 හි එක් කොට්ඨාසයකින් අඩු ආදායම්ලාභීන් 100 ත් 300 ත් අතර ප්‍රමාණයකට සහල් ලබාදීම සභා සම්මත කර තිබුණද, සාධාරණ පදනමක් මත අඩු ආදායම්ලාභීන් තෝරාගෙන නොතිබුණි. | අඩු ආදායම්ලාභීන් තෝරා ගැනීමේ වගකීම නගරාධිපතිතුමා විසින් මන්ත්‍රීවරුන්ට වාචිකව ලබා දී තිබුණු බව. | සාධාරණ පදනමක් මත ප්‍රතිලාභීන් තෝරා ගත යුතුය. |
| (iii) | මුද්‍රා තැබූ මිල ගණන් ලියාපදිංචි තැපැලෙන් හෝ ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් ඉදිරිපත් කළ යුතුව තිබුණද, Whatsapp පණිවිඩ මාර්ගයෙන් මිල ගණන් ලබාගෙන තිබුණු බැවින් ඒවායෙහි රහස්‍යභාවය ආරක්ෂා වී නොතිබුණි. | හදිසි කටයුත්තක් සේ සලකා නගරාධිපතිතුමාගේ උපදෙස් පරිදි නවීන තාක්ෂණය භාවිතා කරමින් (Whatsapp) මිල ගණන් ගෙන්වා ගෙන ඇති බව. | මුද්‍රා තැබූ මිල ගණන් ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ ලංසු කැදවීමේ කාලය අවම වශයෙන් දින 07 ක් විය යුතු වුවත්, ලංසු කැදවීමේ දිනට පසු දින මිල ගණන් භාරගැනීම අවසන් කර ප්‍රසම්පාදන තීරණය මාණ්ඩලික නිලධාරීන් දෙදෙනකු පමණක් අත්සන් කර තිබුණි. | හදිසි අවශ්‍යතාවය මත නගරාධිපතිතුමාගේ උපදෙස් හා නියෝග පරිදි මෙපරිදි කටයුතු කිරීමට සිදුවී ඇති බව. | ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් දිය යුතුය. |
| (v) | භාණ්ඩ සැපයූ පසු ගෙවීම් කරන බව දන්වා තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10(ඇ) වගන්තියටද පටහැනිව, කාර්යසාධන සුරක්ෂණයක් ලබා නොගෙන,කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 50 ක් වූ රු.4,975,000 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. | සභා සම්මත කරගත් යෝජනාව සහ නගරාධිපතිතුමාගේ ලිඛිත උපදෙස් මත 50% අත්තිකාරම් මුදල ගෙවා ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (vi) | සහල් මළු ඇසුරුම් 2 කින් සපයා තිබුණද, ඒ බව ලංසු ලේඛනවල ඇතුලත්කර නොතිබුණි. | මේ බව නගරාධිපතිවරයාට දැන්වූ විට භාරගන්නා ලෙස උපදෙස් ලබා දී ඇති අතර, සාම්පල් PHI මඟින් පරීක්ෂා කර සුදුසු බව නිර්දේශ කර ඇති බව. | ලංසු ලේඛනවල ඇතුලත් කර ඇති ආකාරයට මිලදීගත යුතුය. |
| (vii) | සහල්, බහාලුම් රථ දෙකෙන් ගොඩබෑමකින් තොරව මතුපිටින් පමණක් පරීක්ෂා කර තිබුණි. | සැපයුම් නිලධාරී හා ගබඩාභාරකරු වාහන වලට ගොඩවී දළ වශයෙන් ගණනය කර ඇති බව. | භාණ්ඩ ලද බවට පරීක්ෂා කර තහවුරු කර ගත යුතුය |

(ඇ) රු.657,200 ක වටිනාකමින් යුත් පරිගණක හා පරිගණක උපකරණ මිලදීගැනීම

| | | | |
|---|---|---|---|
| (i) | පරිගණක හා පරිගණක උපකරණ මිලදී ගැනීම සඳහා පිරිවිතර සකස් කර නොතිබුණු අතර ලංසු කැදවීම සඳහා අවම කාලසීමාව දින 7 ක් වුවත් ලංසු කැඳවීමේ සිට ගෙවීම් අනුමත කිරීම දක්වා සියලු කටයුතු 2022 ජනවාරි 03 දින සිදුකර තිබුණි. | නගරාධිපතිතුමා විසින් ඍජුව ඇණවුම් කර තිබුණු බව. | ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් දිය යුතුය |
| (ii) | මිලකැදවීමක් කල බවට සාක්ෂි නොතිබුණු අතර, මිල ගණන් එවා ඇති ආයතන 3 න් 2 ක් ලියාපදිංචි සැපයුම්කරුවන්ද නොවීය. ලංසු භාරගන්නා අවසන් දිනය, ලංසු විවෘත කරන දිනය සහ වේලාව ලංසු ලියවිලි වල සඳහන් වී නොතිබුණි. | කටයුත්තේ හදිසි බව හේතුවෙන් අත් මිල ගණන් (Shopping) මඟින් මිල ගණන් කැඳවා ඇති බව. | ලියාපදිංචි සැපයුම්කරුවනගෙන් මිලගණන් කැඳවිය යුතු අතර ලංසු ලියවිලි වලඅදාල තොරතුරු ඇතුලත් කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රු.1,401,000 ක වටිනා පරිගණක හා පරිගණක උපකරණ මිලදීගැනීම | | |
| (i) | ලංසු කැඳවීම සඳහා අවම කාලසීමාව දින 07 ක් වුවත්, දින 04 ක් පමණක් ලබාදී තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නොමැති අත් මිල ගණන් කැඳවා තිබුණු බැවින් මිල ගණන් වල රහස්‍යභාවය ආරක්ෂාවී නොතිබුණි. | මිල ගණන් ලබා ගැනීම, තාක්ෂණික ඇගයීම් කමිටු, වාර්තා ලබා ගෙන ඇණවුම් කිරීම, නගරාධිපතිතුමාගේ ආවරණ අනුමැතියට යටත්ව සිදු වූ බව. | ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් දිය යුතුය |
| (ii) | පළමුවර මිලදී ගත් ආයතනයෙන්ම දෙවන වර මිලදී ගෙන තිබුණු අතර, භාණ්ඩ අවශ්‍යතාවය කලින් නිර්ණය කර එක්වර මිලදී නොගැනීම හේතුවෙන් මාස 03 අතුලත මිලගනන් විශාල ලෙස වැඩිවී තිබුණු බැවින් සභාවට රු.304,800 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීන කර ගැනීමට පරිගණක අවශ්‍ය වූ අතර රටේ පැවති ආර්ථික තත්වය නිසා මිල වෙනස් වී ඇති බව. | සැලැස්මකට අනුව එකවර මිලදී ගත යුතුය |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 සැප්තැම්බර් 18 දිනැති අංක 29/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයින්ගේ ස්ථිර පත්වීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, 2019 නොවැම්බර් 19 දින ස්ථිර පත්වීම් 59 ක් ලබාදී ඒ සඳහා අදාල අනුමැතියට යවා තිබුණේ 2021 පෙබරවාරි 15 දිනය. වැඩ/ ක්ෂේත්‍ර/ සෞඛ්‍ය කම්කරුවන් 52 ක් සඳහා 2023 ජනවාරි 10 දින වන විටත් එම අනුමැතිය ලැබී නොතිබුණි. | රට වසා තැබීම, කාර්යය මණ්ඩලය කැඳවීම සීමා කිරීම, කාර්යාල වසා තැබීම සහ සේවකයින් කොවිඩ් ආසාධිතයින් බවට පත්වීම නිසා අනුමැතියට යැවීම ප්‍රමාද වූ අතර 2021, 2022 වර්ෂවල ලිපි යවා ඇතත් අනුමැතිය ලැබී නොමැති බව. . | කාල ප්‍රමාදයන් රහිතව ලිපි ඉදිරිපත් කල යුතු අතර අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | ගම්පහ මහානගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය අංශයෙන් ස්ථිර වැටුප් ලබන සෞඛ්‍ය කම්කරුවන් 97 දෙනෙකුගෙන් 37 දෙනෙකු සෞඛ්‍ය අංශයට අදාළ නොවන කාර්යයන් සඳහා යොදවාගෙන තිබුණු අතර, 14 දෙනෙකු සෞඛ්‍ය පරිපාලක සහ වැඩබලන සෞඛ්‍ය පරිපාලකවරුන් ලෙස යොදවාගෙන තිබුණු බැවින් ප්‍රමාණය හෙක්ටයාර 3,750 ක් පමණ වන ග්‍රාම සේවා වසම් 33 පුරා පිහිටි සභා බලප්‍රදේශයේ දෛනික සේවා සඳහා ස්ථිර වැටුප් සෞඛ්‍ය කම්කරුවන් 46 දෙනෙකු පමණක් යොදවා ගැනීමට සිදුව තිබුණි. | වෙනත් අංශවලට යොදවාගෙන ඇත්තේ කාර්යාලය තුළ විවිධ අංශවල තිබෙන රාජකාරි ඉටුකරවා ගැනීම සහ කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු පැවති බව. | සෞඛ්‍ය අංශයේ කම්කරුවන් සෞඛ්‍ය අංශයේ කටයුතුවල යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘති පදනම යටතේ සේවකයින් 75 ක් අනුමැතියක් නොමැතිව බඳවාගෙන 2020 වර්ෂයේ රු.14,144,245 ක්ද, 2021 වර්ෂයේ රු.15,536,821 ක්ද හා 2022 වර්ෂයේ රු.15,577,694 ක්ද ලෙස ගෙවීම් කර තිබුණි. | පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට යවා ඇතත් අඩුපාඩු නිසා එකඟතාවය ලබාදී නොමැති බව . | ව්‍යාපෘතීන් සහ ව්‍යාපෘති සේවකයින් අනුමත කර ගත යුතුය. |
| (ඈ) | කාණු පිරිසිදු කිරීම සඳහා ව්‍යාපෘති කම්කරුවන් 8 දෙනෙකු බඳවාගෙන සිටි නමුත් මහා නගර සභා ආඥා පනතේ 100 වගන්තිය ප්‍රකාරව කිසිදු කාණුවක් පිරිසිදු කර නොතිබුණු අතර ඔවුන්ගෙන් හත් දෙනෙකු සෞඛ්‍ය අංශයෙහි වෙනත් කාර්යයන් සඳහා ද එක් අයෙකු සෞඛ්‍ය අංශයෙහි නොසිටි බවද නිරීක්ෂණය විය. | සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම මත කාණු පිරිසිදු කිරීමේ කටයුතු සඳහා අවශ්‍යතාවය මත යොදවා ඇති බව. | කාණු පිරිසිදු කිරීමේ ව්‍යාපෘති කම්කරුවන් ඒ කටයුතු සඳහා යෙදවිය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට සේවක ණයශේෂය, ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය සහ වැඩ තහනම් කර ඇති නිලධාරීන් 40 දෙනෙකුගෙන් රු. 298,040 ක් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිටද, නිලධාරීන් 3 දෙනෙකුගෙන් රු.67,620 ක් වසර 3 ත් 5 ත් අතර කාලයක සිටද අයවීමට තිබුණි. | විශ්‍රාම ගිය, වැඩ තහනමට ලක් වූ සියළුම සේවකයින්ට ලිපි යොමු කර ඇති බව. | සේවක ණය ශේෂ අයකල යුතුය. |